# පළාත් පාලන දෙපාර්තමේන්තුව - වයඹ පළාත
## உள்ளூராட்சி திணைக்களம் - வடமேல் மாகாணம்
## Department of Local Government - NWP

2වන මහල, බී දොරටුව,
පළාත් සභා කාර්යාල සංකීර්ණය,
කුරුණෑගල.

2ஆம் மாடி, பீ நுழை வாயில்,
மாகாண சபை அலுவலக கட்டிடத் தொகுதி,
குருநாகல்.

2nd Floor, B Entrance,
Provincial Office Complex,
Kurunegala.


| | | | |
|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My No | ව.ප.පා.දෙ/01/11/04/01 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | දිනය<br>திகதி<br>Date 2019.01. 10 |

ප. පා. කො. චක්‍රලේඛ අංක 2019/01

සියලුම නගර සභා හා ප්‍රාදේශීය සභා ගරු සභාපතිවරුන්/ ලේකම්වරුන් වෙත,

**<u>වයඹ පළාතේ පළාත් පාලන ආයතන වල දේපළ වාර්ෂික බදුදීම සම්බන්ධ කටයුතු විධිමත් කිරීම</u>**

වයඹ පළාතේ පළාත් පාලන ආයතන විසින් වාර්ෂිකව සභාව සතු දේපළ බදු දීමේ දී ඒකාකාරි ක්‍රමයක් අනුගමනය නොකිරීම මත විගණන විමසුම් වලට ලක්වීම, හිඟ ආදායම් ඉහල යාම, නීතිමය ක්‍රියාමාර්ග ගැනීමේ අපහසුකම් ඇතිවීම, මහජන විරෝධතා ඇතිවීම, බදුකරුවන් මුහුණපාන අපහසුතා ඇතුලු ගැටලු අවම කර ගැනීම සඳහා මෙම චක්‍රලේඛය නිකුත් කෙරේ.

1. මෙම චක්‍රලේඛය 2019.01.01 දින සිට ක්‍රියාත්මක වන අතර, මීට පෙර මේ සම්බන්ධයෙන් පළාත් පාලන කොමසාරිස් විසින් නිකුත් කර ඇති සියලු චක්‍රලේඛ අහිබවා මෙම චක්‍රලේඛය බලාත්මක වන අතර, මීට පෙර චක්‍රලේඛ මත පදනම්ව ගෙන ඇති තීරණවලට මේ තුලින් බාධා ඇති නොවන බව අවධාරණය කරමි.

2. කුලී හා අවම ලංසුව තක්සේරු කිරීම

   මෙම චක්‍රලේඛය ක්‍රියාත්මක 2019.01.01 වන දිනෙන් පසුව එළඹෙන වර්ෂය සඳහා මුල් වරට දේපලක අවම ලංසුව තීරණය කිරීම

   I. අලුත් තක්සේරුවක් ක්‍රියාත්මක කිරීම සඳහා පළාත් පාලන ආයතනයක සීමාව ඇතුලත වන, එක් එක් දේපළක කුලී හා අවම ලංසු වටිනාකම ප්‍රධාන තක්සේරුකරු හෝ ඔහුට එම කාර්යය අපේක්ෂිත කාලය ඇතුලත ඉටුකර දිය නොහැකි බව සනාථ කර ගැනීමෙන් පසුව සහකාර කොමසාරිස්වරයාගේ අනුමැතිය ඇතිව, පළාත් පාලන ආයතනය විසින් පත් කරගනු ලබන යම් සුදුසුකම් ලත් තැනැත්තෙකු විසින් තක්සේරු කරගනු ලැබිය යුතුය.

   II. අනතුරුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඉහත (I) ඡේදයේ අනුව තීරණය කල අවම ලංසුව හෝ ඊට නොඅඩු වෙළඳපොල වටිනාකමක් තීරණය කිරීමට පළාත් පාලන ආයතනයට හැකිය. එසේ වුවද, යම් විශේෂිත අවස්ථාවකදී එකී පූර්ව වර්ෂයේ මුදලට වඩා අඩු වෙළඳපොල වටිනාකමක් සහිත අවම ලංසුවක් තීරණය කළ යුතු වන අවස්ථාවකදී ඒ සඳහා සුදුසුකම් ලත්

ශ්‍රී




කාර්යාලය / அலுவலகம் / Office - 037 2222171
ෆැක්ස් / பெக்ஸ் / Fax - 037 2228018
කොමසාරිස් / ஆணையாளர் / Commissioner - 037 2228039
සහකාර කොමසාරිස් / உதவி ஆணையாளர் / Assit. Commissioner - 037 2227120
Web : www.dolgnwp.lk E-mail : dolgnwp@yahoo.com

තැනැත්තෙකු විසින් තක්සේරු කරනු ලබන දේපළෙහි අවම ලංසු වටිනාකම පළාත් පාලන කොමසාරිස්වරයාගේ පූර්ව ලිඛිත අනුමැතිය ලබා ගැනීමට යටත්ව තීරණය කළ යුතුය.

III. ලංසු කැඳවීමට පෙර අදාළ දේපළෙහි අවම ලංසුව, ලංසු කොන්දේසි හා ගිවිසුමේ කෙටුම්පත, ලංසු විවෘත කිරීමේ කමිටුව හා ලංසු ඇගයීමේ කමිටුව මහා සභා තීරණයක් මගින් අනුමත කර තිබිය යුතුය.

3. බදු දීමට අදාල ප්‍රසම්පාදන දැන්වීම් පළකිරීම

I. එළඹෙන වර්ෂයට අදාල දේපළ වාර්ෂිකව බදු දීමේදී ප්‍රසම්පාදන දැන්වීම ප්‍රවර්තන වර්ෂයේ සැප්තැම්බර් **15** වන දිනට ප්‍රථම ජාතික වශයෙන් පළකරනු ලබන, අවම වශයෙන් සිංහල පුවත්පතක හා දෙමළ පුවත්පතක බැගින් පළකරනු ලැබිය යුතු අතර ප්‍රාදේශීය වශයෙන් දැන්වීම් පළකිරීමෙන්ද, ප්‍රවර්තන වර්ෂයේ බදුකරුවන් වෙත ලිඛිතව දැනුම්දීමෙන් ද සිදුකල යුතුය.

II. ලංසු අයදුම්පත්‍ර නිකුත් කරනු ලැබීමට තීරණය කරන ලද දිනය හා ලංසු භාරගැනීම අවසන් කිරීමට තීරණය කරන ලද දිනය අතර දින **21** ක අවම කාලයක් තිබිය යුතුය.

III. ප්‍රසිද්ධ කරන ලද ප්‍රසම්පාදන දැන්වීමට අනුව ඉල්ලුම්කරුවන් කිසිවෙකු ඉදිරිපත් නොවූ අවස්ථාවකදී හෝ ඉදිරිපත්වී ඇති ඉල්ලුම්කරුවන් සුදුසුකම් නොලබන අවස්ථාවකදී, දෙවන වතාවේදී හෝ අවස්ථාවෝචිත පරිදි තුන්වන හෝ ඊට වැඩි අවස්ථාවලදී ද ප්‍රාදේශීය වශයෙන් දැන්වීම් පළකිරීමෙන්ද ප්‍රසම්පාදන කාර්යය සිදුකල හැකි අතර, එම කටයුතු ප්‍රවර්තන වර්ෂයේ නොවැම්බර් **15** දිනට පෙර සිදුකර අවසන් කළ යුතුය.

IV. තුන්වන වරට ද ප්‍රසම්පාදන දැන්වීම පළකිරීමෙන් අනතුරුව ද ගැණුම්කරුවන් ඉදිරිපත් නොවන දේපල සඳහා අවම ලංසුව සංශෝධනය කිරීමට හෝ වෙනත් ආකාරයකින් ක්‍රියා කිරීමට අවශ්‍ය අවස්ථාවක දී, ලේකම්වරයා විසින් ඉදිරිපත් කරනු ලබන සාධාරණීකරණ වාර්තාවක් මත සභාවේ මුදල් පිළිබඳ බලය පැවරූ කාරක සභාවේ නිර්දේශය මත, මහ සභාව විසින් තීරණය කරනු ලබන අවස්ථාවක දී එකී සාධාරණීකරන වාර්තාව, මුදල් කටයුතු පිළිබඳ බලය පැවරූ කාරක සභාවේ වාර්තාව සහ මහ සභා තීරණය සමඟ පළාත් පාලන කොමසාරිස් වෙත ඉදිරිපත් කර අනුමැතිය ලබාගත යුතුය.

V. ප්‍රසම්පාදන දැන්වීම තුළ අදාල දේපළෙහි අවම ලංසුව, අයදුම්පත්‍ර නිකුත් කරනු ලබන ආරම්භක දිනය, අවසන් දිනය හා වේලාව, ආපසු ගෙවන ලංසු තැන්පතුව, ආපසු නොගෙවන ගාස්තුව, අයදුම්පත් භාරගන්නා ආරම්භක දිනය, අවසන් දිනය හා වේලාව, අයදුම්පත් භාර ගන්නා ස්ථානය, අයදුම්පත් විවෘත කරනු ලබන දිනය, වේලාව හා ස්ථානය, අයදුම්පත් භාරදිය යුතු ආකාරය ආදිය අනිවාර්යයෙන් දැක්විය යුතුය.

පහත දැක්වෙන ආකාරයට ගණන් බලන ලද ලංසු ඇපයක් සහ ඊට අතිරේකව සභාව තීරණය කළ ආපසු නොගෙවනු ලබන ලංසු අයදුම්පත්‍ර ගාස්තුවක් අයකරනු ලැබිය යුතුය.

- රු. **100,000.00** අඩු අවම ලංසුවකට ලංසු වටිනාකමින් **10%**ක් ලෙස ද ,

1/10